# මහායානයට එල්ල වූ තර්ජනය

පස්වැනි සියවසේ දී පමණ ලංකාවේ හා ආන්ද්‍ර ප්‍රදේශයේ විසූ ථෙරවාදී භික්ෂූන්වහන්සේ බුදුසසුන ආරක්ෂාකිරීමට තීරණයකිරීම ඓතිහාසික වශයෙන් ගත්කල ඵලදායී වී ඇත්තේ ලංකාවේ ය. පස්වැනි සියවසේ භාරතයේ හින්දු සංස්කෘතියක් හෝ හින්දු ආගමක් හෝ නොතිබූ නමුත් එවැනි දැහි දළ සටහන් සමාජයේ වර්ධනය වෙමින් පවතින්නට ඇතැයි සිතිය හැකි ය. මහායානයේ මාධ්‍යමිකවාදය මේ වන විට ප්‍රශ්නවලට මුහුණ පාමින් සිටි බව ද විශේෂයෙන් ම ආන්ද්‍ර ප්‍රදේශ වාසී භාරතීය ථෙරවාදී භික්ෂූන්වහන්සේට වැටහෙන්නට ඇත.

ථෙරවාදයට මාධ්‍යමිකයන්ගෙන් වූ ප්‍රශ්න හමුවේ ඒවාට පිළිතුරු දීගත නොහැකිවීම ථෙරවාදය ආරක්ෂාකිරීමට තීරණයකිරීමේ දී බලපෑ ප්‍රධාන සාධකය වුව ද භාරතයේ මතුවෙමින් පැවති තත්වය ථෙරවාදයට පමණක් නොව මහායානයට ද තර්ජනයක් විය. බුදු දහමට භාරතයේ දී බ්‍රාහ්මණ ආගම්වලින් එල්ල වූ ප්‍රධානම ප්‍රශ්නය වූයේ ආත්මය පිළිබඳ ප්‍රශ්නය ය. භවයෙන් භවයට යන ආත්මයක් නොමැතිව කර්මවාදය තේරුම්ගැනීම පහසු කටයුත්තක් නො වී ය. භවයෙන් භවයට යන සත්වයකු, ආත්මයක් නොමැතිව කර්ම ඵලය විඳින්නට සිදුවන්නේ කා හටද යන ප්‍රශ්නයට පිළිතුරක් සෙවීමට බුදුදහමට සිදුවිය.

එහි දී ථෙරවාදයෙහි විවිධ පිළිතුරු නිර්මාණය වූ නමුත් ඒ එකක්වත් බ්‍රාහ්මණ ආගම් ඇදහූවන් සතුටුකිරීමෙහි ලා සමත් වී නැති බව පෙනී යයි. ධර්මවාදය, ධර්මයක් පවත්නා ක්ෂණය ගැන කියැවෙන ක්ෂණවාදය පමණක් නොව ස්වභාවය පිළිබඳ දැනුමක් ද ථෙරවාදීන් අතින් නිර්මාණය විණි. එයට අමතරව මිලින්ද ප්‍රශ්නයෙහි දැක්වෙන න ච සො න ච අඤ්ඤො යන පිළිතුර ද වැදගත් විය. පරලොව යන්නේ කවුදැයි මිළිඳු රජතුමා ඇසූ ප්‍රශ්නයට නාගසේන හිමියන් දුන් පිළිතුර වූයේ තමාත් නොවේය අන් අයකුත් නොවේය යන්න ය. න්‍යායික ලෙස ගත්කල එය සෑහීමකට පත්විය හැකි පිළිතුරක් වුවත් කර්ම ඵලය විඳින්නේ කවු ද යන ප්‍රශ්නය පිළිතුරක් නැතිව ම අත්හරිනු ලැබී ය.

බ්‍රාහ්මණයන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු ලෙස ථෙරවාදීන් ඉදිරිපත්කළ ස්වභාවය, ධර්මය, ක්ෂණය ආදියෙහි ආත්මවාදයක් තිබූ බව සැඟවිය නො හැකි ය. නාගර්ජුනපාදයන් වහන්සේ මේ ආත්මවාදය ඛන්ඩනයකිරීම සඳහා මාධ්‍යමිකවාදය දේශනා කළහ. එහි දැඩි ආකර්ෂණයක් වූ බව පැහැදිලි ය. උන්වහන්සේ පටිච්චසමුප්පදායම ගුරුකොට ගත්හ. ධර්මයක ස්වභාවයක් ඇතැයි යන්න උන්වහන්සේ අතින් ඛන්ඩණය විය. ලෝකය සංකල්පීය වශයෙන් ගත්කල ශූන්‍ය යැයි උන්වහන්සේ දේශනා කළහ.

බුදුන්වහන්සේ ද ඇතැම් අවස්ථාවල අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ශූන්‍ය යනුවෙන් දේහනාකර ඇති බැවින් සංකල්පීයව ලෝකය ශූන්‍ය යැයි දේශනාකිරීම ගැටළුවක් නො වෙයි. අප තනාගන්නා සංකල්ප අපේ නිර්මාණ මිස ස්වභාවික ව පවත්නා දෑ නො වේ. කිසිදු ධර්මයකට එහිම යැයි කිවහැකි ස්වභාවයක් නැත. ධර්මයකට ස්වභාවයක් ඇතැයි කීම ඒ ධර්මයට ආත්මයක් ආරෝපණයකිරීමක් වෙයි. ධර්ම ද අපේ නිර්මාණ බව නාගර්ජුනපාදයන්ගේ අදහස වෙයි.

උන්වහන්සේගේ අනාත්මවාදය, එයට වාදයක් යැටි කියන්නේ නම්, ධර්ම නෛරයාත්මවාදයක් විය. එය හුදු ජීව නෛරයාත්මවාදයෙන් ඔබ්බට ගිය එකක් විය. ආත්මවාදයක් ඇත්තේ ජීව සම්බන්ධයෙන් පමණක් නොවන බව උන්වහන්සේ දෙසූහ. පුටුවට පුටුව යැයි යමකු කියන විට පුටුවට “ආත්මයක්” දී අවසාන ය. මේ සම්බන්ධයෙන් ථෙරවාදීන් කළයුතුව තිබුණේ මාධ්‍යමික මතවාදය ඉවසා ඒ පිළිගැනීම ය. එහෙත් උන්වහන්සේ එසේ නො කළහ. එහි ප්‍රතිඵලය වූයේ ඇතැම් භික්ෂූන්වහන්සේ ද මාධ්‍යමිකවාදය දෙසට නැඹුරුවීම ය.

ලංකාවේ විසූ ආර්යදේව නම් භික්ෂූන්වහන්සේ නමක් නාගර්ජුනපාදයන් වහන්සේ මුණගැසී මාධ්‍යමිකවාදය පිළිගෙන ඇත. ඇතැමුන් විශ්වාසකරන අන්දමට මාධ්‍යමිකවාදීන් අතර නාගර්ජුනපාදයන්වහන්සේට පසුව ප්‍රධාන තැනැත්තා වී ඇත්තේ ආර්යදේව භික්ෂූන්වහන්සේ ය. ආර්යදේව හිමියන් අනුගමනය කළ තවත් භික්ෂූන්වහන්සේ ලංකාවේ එකල වැඩ විසූ බවට සැකයක් නැත.

© Prof. Nalin De Silva

වළගම්බා රජු අභයගිරිය  තිස්ස හිමියන්ට පූජාකළ අවස්ථාවේ උන්වහන්සේ සමග ඒ විහාරයට වැඩමකිරීමට භික්ෂූන්වහන්සේ පන්සිය නමක් ඉදිරිපත්වීමෙන් පෙන්නුම්කරන්නේ එකල ද මහාවිහාර ධර්මයට පටහැණිව සිතූ භික්ෂූන්වහන්සේ මහාවිහාරයෙහි ම වැඩවිසූ බව ය. අභයගිරිය සමස්තයක් ලෙස ගත්කල මාධ්‍යමිකවාදය නොපිළිගත්ත ද එහි ඇතැම් කොටස් ගැන සානුකම්පිකව බැලූ බවට සැකයක් තිබිය හැකි නො වෙයි. මහාවිහාරික භික්ෂූන්වහන්සේ තුන්වැනි සංගායනාවෙන් පසුව ලැබී සිංහල බුද්ධාගම බවට පත්වූ ධර්මය හා වත්පිළිවෙත් දිගට ම අනුගමනය කළ අතර, අභයගිරි වාසී භික්ෂූන්වහන්සේ දඹදිවින් පසුව පැමිණි මතවාදවලට ද සවන්දුන්හ.

එහෙත් මේ ප්‍රශ්නය එසේ ලඝුකර දැක්වීම ද නිවැරදි නො වෙයි. ඇතැමුන් සඳහන්කරන ආකාරයට අභයගිරිය භික්ෂූන්වහන්සේ ලාංකේය සම්ප්‍රදායක් අනුගමනය කළ අතර මහාවිහාර භික්ෂූන්වහන්සේ භාරතීය සම්ප්‍රදායට වඩා නැඹුරුවූහ. මෙහි යම් සත්‍යයක් නැතිවා නො වෙයි. එහෙත් එසේ වී නම් ඒ වන්නට ඇත්තේ පස්වැනි සියවසෙන් පමණ පසුව යැයි සිතිය හැකි ය. මහාවිහාරික භික්ෂූන්වහන්සේ ද මෙරට භික්ෂූන්වහන්සේ මිස වෙනත් දේශයකින් වැඩමකළ භික්ෂූන්වහන්සේ නො වූහ. උන්වහන්සේ පැවත ආවේ මිහිඳු හිමියන් හඳුන්වා දුන් සම්ප්‍රදායෙහි මිස වෙනත් සම්ප්‍රදායක නො වේ.

මහාවිහාරය ආරම්භයේ දී සිංහල ථෙරවාද බුදුදහමෙහි මධ්‍යස්ථානය විය. එය ලෝක ථෙරවාද මධ්‍යස්ථානයක් බවට පත්වන්නට ඇත්තේ ථෙරවාද නොවන බෞද්ධ සම්ප්‍රදායන් දඹදිව ප්‍රචලිතවීමෙන් පසුව විය යුතු ය. ආරම්භයේ දී ම යක්ෂ ගෝත්‍රිකයන්ගේ විරෝධතාවක් බුදුදහමට එල්ලවන්නට ඇතැයි අපට සිතාගත හැකි ය. මෙරට බෞද්ධ සාහිත්‍යයෙහි යක්ෂයන් පිළිබඳ සඳහන්වන කතාවලින් ද පැවසෙන්නේ යක්ෂයන් බෞද්ධයන් වීමට දක්වා ඇති අකමැත්ත ය. එසේ වුවත් යක්ෂයන්ගෙන් බෞද්ධයන් වූ පිරිස අනෙක් සිංහල බෞද්ධයන් මෙන් ම සිංහල බෞද්ධ වත්පිළිවෙත් අනුගමනය කළාට සැකයක් නැත.

මහාවිහාරය දඹදිවට පක්ෂපාති වූ අතර අභයගිරිය දේශීය වී යැයි පවසන අය එසේ කියන්නේ මහාවිහාරය විසින් පසුව සිංහල බුද්ධාගම ආරක්ෂාකිරීමට ගන්නා ලද තීරණය නිසා විය යුතු ය. ඔවුන්ට අනුව මහාවිහාරය කර ඇත්තේ දඹදිවින් ලැබුණු දහමක් ආරක්ෂාකිරීම ය. එහෙත් ඔවුහු මේ දහම සිංහල බුද්ධාගම බව අමතක කරති. ඒ හුදෙක් තුන්වැනි ධර්ම සංගායනාවේ ධර්මය නො විණි. ඒ සිංහල සංස්කෘතියට අවශෝෂණය කරගනු ලැබූවක් විය.

අනෙක් අතට අභයගිරියෙහි වැඩ විසූ භික්ෂූන්වහන්සේ දේශීය දැනුමක් වර්ධනයකළ බවට සාක්ෂි නැත. දඹදිවින් පසුව මෙරටට පැමිණි බුදුදහමේ විවිධ අර්ථකථනවලට ඉඩදුන්නේ අභයගිරිය ය. මේ යක්ෂ සම්ප්‍රදාය නො වෙයි. යක්ෂ සම්ප්‍රදාය එලෙස පිටින් පැමිණෙන දෑ භාරගැනීමට එතරම් කැමැත්තක් නො දක්වයි. අභයගිරිය අයත්වන්නට ඇත්තේ යක්ෂ සම්ප්‍රදායට වඩා නාග සම්ප්‍රදායට යැයි සිතිය හැකි ය. අභයගිරිය මහායානික වී යැයි කියන අතර දේශීය වී යැයි ද කීම පිළිගත නො හැකි ය.

තිබෙන සාධක හා අපේ අනෙක් දැනුම් සමග ගත්විට අපට කිවහැක්කේ අභයගිරිය මුල දී මහාවිහාරයට වඩා එවකට දඹදිව තිබූ ථෙරවාද නොවන මතවාදවලට නැඹුරු වූ බවත් ඒ මහාවිහාරික භික්ෂූන්වහන්සේගේ සිත්ගත් දෙයක් නොවූ බවත් ය. ලාංකේය වර්ධනයන් මුල දී සිදු වී ඇත්තේ ද මහාවිහාරය ඔස්සේ බව ඒ සම්බන්ධයෙන් ලියැවී ඇති පොතපතින් පැහැදිලි වෙයි. මහාවිහාරයට මුල් කාලයේ දී යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් (සිංහල ජාතිය බිහි වී තිබුණ ද යක්ෂ, නාග ආදී ගෝත්‍ර මුළුමනින් ම නැති වී යෑමට ඉන් පසුව ද යම් කාලයක් ගත වී ඇති බව පැහැදිලි ය.) හෝ යක්ෂ සංස්කෘතික ධාරාවෙන් හෝ බාධා, විවේචන තිබිණි යැයි සිතිය නොහැක්කේ, එකල මහාවිහාරය සිංහල බුද්ධාගම වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම වර්ධනයකිරීමට කටයුතු කර ඇති බැවිනි.

එහෙත් පස්වැනි සියවස පමණ වන විට මේ තත්වයෙහි වෙනසක් දක්නට ලැබෙයි. අප කලින් සඳහන් කල ආකාරයට පස්වැනි සියවසෙන් පමණ පසුව අපේ ඉතිහාසයෙහි සිදු වී ඇති දේ ගැන එතරම් අවබෝධයක් නැත. එනම් ඒ පිළිබඳව අප තවමත් අපේ ප්‍රවාද නිර්මාණයකර නැත. මෙහි සඳහන්වන්නේ ද ඒ පිළිබඳ දළ අදහසක් පමණක් බව අවධාරණය කළ යුතු ය.

© Prof. Nalin De Silva

බුදුගොස් හිමියන් මෙරටට වැඩමකිරීම, සිංහල පොත් පාළියට පෙරළීම, ථෙරවාදයෙහි නිල භාෂාව බවට පාළි භාෂාව පත්වීම ආදී කරුණුවලට යක්‍ෂයන්ගේ හා යක්‍ෂ සම්ප්‍රදායෙහි අනුමැතිය ලැබිණි යැයි සිතිය නො හැකි ය. මේ සියල්ල දඹදිව කුමන්ත්‍රණයක් නිසා සිදු වූ දෑ ද නො වෙයි. ඓතිහාසිකව කරුණු විකාශය වූ ආකාරය මෙහි දී බලපෑ ප්‍රධාන ම කරුණ යැයි සැලකිය හැකි ය. දෙවැනි සියවසේ පමණ සිට මහායානයෙන් ථෙරවාදයට එල්ල වූ අභියෝගය හමුවේ ආරක්‍ෂණවාදී පියවරක් ගැනීමට ආනන්ද හා සිංහල ථෙරවාදී භික්‍ෂූන්වහන්සේ තීරණයකිරීම ඒ සියල්ලට මුල් වී යැයි සිතිය හැකි ය. එහෙත් ඉන් කියැවෙන්නේ ඉන්පසු ථෙරවාදයට හොඳ කල දවසක් උදා වූ බව නො වෙයි. දඹදිව මහායානයට ද තර්ජන හා අභියෝගවලට මුහුණ පෑමට සිදුවූයේ ය. හින්දු ආගම ඇති වී ප්‍රචලිතවීමත් සමග දඹදිවින් ථෙරවාදය පමණක් නොව මහායානය ද අතුරුදහන් විය.

නාගර්ජුනපාදයන්වහන්සේ ථෙරවාදයට විරුද්ධව ඉදිරිපත්කළ ශූන්‍යතාව අවසානයේ දී  මාධ්‍යමිකවාදයට ද ප්‍රශ්න ඇතිකෙළේ ය. හයවැනි සියවසේ බිහිවූ ශංකරාචාර්යවරයෝ ශූන්‍යතා සංකල්පය කණපිට පෙරළා නිර්ගුණ් බ්‍රහ්මන් නම් සංකල්පය නිර්මාණයකළහ. නිරාගුණ් බ්‍රහ්මන් ධනාත්මක සංකල්පයක් විය. සාමාන්‍ය ජනයා ශූන්‍යතාව යන්නට වඩා නිර්ගුණ් බ්‍රහ්මන් ප්‍රියකිරීම පුදුමයක් නො වෙයි. නිර්ගුණ් බ්‍රහ්මන් අද්වෛත විය. එනම් නිර්ගුණ් බ්‍රහ්මන් හැරෙන්නට වෙනත් දෙවැන්නෙක්  නැත. ඇත්තේ  නිර්ගුණ් බ්‍රහ්මන් පමණ ය. අනෙක් සියල්ල මායාවන් වෙයි. අප යනු ද මායාව නිසා ඇතිකරගනු ලැබූ සංකල්ප වෙයි. අප සසර සැරිසරන්නේ අප නිර්ගුණ් බ්‍රහ්මන්ගෙන් වෙන්වී ඇතැයි අප සිතන බැවිනි. එසේ සිතීම නැතිවූ විට විමුක්තිය ලැබෙයි. සාමාන්‍ය ජනයාට අද්වෛත නිර්ගුණ් බ්‍රහ්මන් නිවනට වඩා ආකර්ෂණීය වෙයි. දඹදිවින් ථෙරවාදය පමණක් නොව මහායානය ද අතුරුදහන් විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva